# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2359/09 - 2023 නොවැම්බර් මස 20 වැනි සඳුදා - 2023.11.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් පාලන ආඥාපනත**

1969 අංක 11 දරන පනතින් සංශෝධනය වූ 1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් පාලන ආඥාපනතේ 3 වැනි සහ 6 (10) වැනි වගන්ති ප්‍රකාරව ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන නියෝග.

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
ජනමාධ්‍ය අමාත්‍ය.

2023 නොවැම්බර් මස 15 වැනි දින,
කොළඹ,
ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

නියෝග

2023 අගෝස්තු 11 වැනි දිනැති අංක 2344/40 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද, රැඟුම් පාලක පනතේ බලපත්‍ර ගාස්තු අය කිරීමේ 2023 අංක 1 දරන නියෝගය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරමි.

1. එහි "1912 අංක 07 දරන ප්‍රසිද්ධ රැඟුම් පාලක පනත" ලෙස සඳහන් සෑම සඳහනක්ම වෙනුවට "1912 අංක 7 දරන ප්‍රසිද්ධ රැඟුම් පාලන ආඥාපනත" යන්න ද "රැඟුම් පාලක පනත" ලෙස සඳහන් සෑම සඳහනක්ම වෙනුවට "රැඟුම් පාලන ආඥාපනත" යන්න ද ආදේශ කිරීමෙන්;

2. එහි අංක 02 (අ) (i) අනු නියෝගය වෙනුවට පහත සඳහන් අනු නියෝගය ආදේශ කිරීමෙන් සහ මෙම අනු නියෝගය 2023 දෙසැම්බර් මස 01 වැනි දින සිට බලාත්මක කිරීමෙන්;

   "විදේශීය චිත්‍රපට සඳහා (පූර්ව ප්‍රචාරක පටය ද ඇතුළත්ව) - රුපියල් 30,000.00"

EOG 11-0208

1A - G 40795 — 07 (2023/11)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*